# 1 වන දවස

## ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි (අබ්බා)

ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේව අමතන්නේ **"අබ්බා"** යනුවෙනි. පියාණන් වහන්සේ සහ පුත්‍රයාණන් අතර පැවතුණු ගැඹුරුම සම්බන්ධතාවය මෙම වචනයෙන් පැහැදිලි වේ. දෙවියන් වහන්සේට අබ්බා යනුවෙන් අමතන විට මෙය අත දරුවෙක් තම පියාට **"තාත්තා"** කියා කීම බඳු ඇමතීමකි. මේ වචනය තුළ ඉමහත් ලෙන්ගතුකමක් සහ ළබැඳි ස්වරූපයක් ඇත. පියාණන් වහන්සේ සහ ක්‍රිස්තුන් වහන්සේ අතර ඉතා ගැඹුරු සම්බන්ධතාවයක් පවතින අතර එම සම්බන්ධතාවය සමිඳුන්ගේ වදනින් ම පැහැදිලි වේ. **"මා දුටු තැනැත්තේ පියාණන් වහන්සේ දුටුවේ ය"** යයි සමිඳාණෝ පවසන සේක (ශු. ජොහාන් 14:9). දෙදෙනා වහන්සේලා අතර තිබෙන ගැඹුරු සම්බන්ධතාවය කොපමණ ද කිවහොත් පියාණන් වහන්සේ ගැන දැන ගැනීමට නම් පුත්‍රයාණන් වහන්සේ දෙස බැලීම අත්‍යාවශ්‍යය ය. මෙම චතාරික සමයේ දී සමිඳාණන් වහන්සේ අපට ඉගැන්වූ යාච්ඤාව මුල් කරගෙන භාවනාවක යෙදෙමු. පියාණන් වහන්සේ ගැන දැන ගැනීමට පුත්‍රයාණන් වහන්සේ දෙස අපගේ නෙත සිත හදවත යොමු කරමු.

**දවස පුරා :-**
- ✵ ''ස්වර්ගයේ වැඩ සිටින අපගේ අබ්බා තාත්තේ'' කියා නිතර නිතර උච්චාරණය කරමු.
- ✵ පුබුදු ගීතාංජලී ගී අංක 140 (පළමු පද දෙක ගායනා කළ හැක.)